# පරණකුරු කෝරළේ නැගෙනහිර කෘෂිකර්ම ව්‍යාප්ති කොට්ඨාශය

ගොවිකම් ව්‍යාප්ති සේවයේ නියුක්ත නිලධාරීන් ගෙන් ඉටුවිය යුතු පළමු හා ඉතා වැදගත් සේවය ඔවුන්ගේ රාජකාරි කොට්ඨාශයේ ගොවීන්ගේ සිත් දිනා ගැනීම වෙයි. ගොවිකම් ව්‍යාප්ති සේවයට නව පණක් හා නව මුහුණුවරක් අයත්වීමෙන් පසු ව්‍යාප්ති නිලධාරීන් වැඩි සංඛ්‍යාවකින් මෙම කාර්‍ය්‍ය සඳුවුදුයක අන්දමට ඉටුවනවා අපට පෙනී තිබේ. නමුත් ග්‍රාමීය ජනතාවගේ මෙන් ප්‍රදේශයේ අනෙක් රජයේ නිලධාරීන්ගේ පමණක් නොව රට රාජ්‍යය කරන්නන්ගේ පවා සිත් දිනා තම කටයුතු ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන නිලධාරීන් ගොවිකම් ව්‍යාප්ති සේවයේ ඇත්තේ අතලොස්සකි. මෙම සුළු සංඛ්‍යාවෙහිද ප්‍රමුඛස්ථානය ගැනීමට සමත් ගොවිකම් ව්‍යාප්ති මණ්ඩලයක් මෙවර අපට මුණගැසුනේ පරණකුරු කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ ගොවිකම් ව්‍යාප්ති වැඩ නැරඹීමට කෑගල්ලේ රත්වල ගොවිකම් ව්‍යාප්ති මධ්‍යස්ථානයට ගිය විටය.

කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි ඒ. පී. බස්නායක මහතා සහ ඔහුගේ නිලධාරි මඩණ්ලය පළාතේ ගොවීන් හඳුනති. ගොවීන් නිලධාරි මණ්ඩලය හඳුනති. එය ප්‍රදේශය ගොවිතැනින් දියුණු තත්ත්වයකට නඟාලීමට හැකිවූ කරුණු රාශිය අතුරින් මූලික කරුණ බව අපි දනිමු. පරණකුරු කෝරළේ නැගෙනහිර කොටසේ ගොවීන්ට කෘෂිකාර්මික පැනයක් වීනම් එය විසඳා ගැනීමට යා යුතු තැන කොතැනකට දැයි ඔව්හු දනිති. විමසන්නේ කවරෙකුගෙන්දැයි එයද දනී. ග්‍රාමීය ජනතාව ගොවිකම් ව්‍යාප්ති මධ්‍යස්ථානය හා ගොවිකම් ව්‍යාප්ති නිලධාරීන් අඳුනන බවට හොඳම සාක්ෂිය මෙය වෙයි. අළුත් කෘෂිකාර්මික සොයාගැනීම් ගොවීන් වෙත මෙහි ව්‍යාප්ති නිලධාරීන් රැගෙන යන්නේද නැණවත් මාර්ගයකිනි. නවීන දියුණු අදහස් මෙරට ගොවීන්ට ඉදිරිපත් කළ යුත්තේ ක්‍රමයෙන්, වරකට මඳ වශයෙනි. අප ඉදිරිපත් කරන අදහස කුමක්දැයි වටහා ගැනීමට ගොවීන්ට හැකිතරම් දිගු කාලයක් වෙන් කළ යුතුය. උරාගත් අදහස ක්‍රියාත්මක කර එයින් ප්‍රයෝජන ලබන විට පමණය, එවැන්න විශාල වශයෙන් ව්‍යාප්ති කළ යුත්තේ. මෙම කොට්ඨාශයේ ගොවිකම් ව්‍යාප්ති වැඩ ඉටුවන්නේද මෙලෙසටමයි. නිලධාරීන් පමණක් නොව ගොවීන් පවා බුද්ධිමතුන් බව මෙම කරුණුවලින් හෙළිවේ.

බුද්ධිමත් ගොවීන් අතුරින් පෙරමුණ ගෙන තමාට වඩා අනෙක් අයට ලාභ ප්‍රයෝජන ලබාදීමට උත්සාහ කරන ගොවි මහතෙක් අපට පරණකුරු කෝරළේ නැගෙනහිර කොටසේ සංචාරයේදී හමුවූයේ භාග්‍යයකිනි. ඔහු අන් කෙනෙකු නොව පළාතේ මන්ත්‍රී පී. ආර්. රත්නායක මහතාය. ගොවිතැනට විශෙෂ ලැදියාවක් හා ආශාවක් දක්වන රත්නායක මහතා සමිති සමාගම් හා සමාජ රැස්වීම්වලදී පමණක් නොව ගොවීන් පෞද්ගලිකව හමුවූ විට පවා දියුණු ගොවිතැන් ක්‍රම පිළිපැදීමට ආයාචනා කරයි. රත්නායක මහතාගේ නොමසුරු සහයෝගය නිසා මෙම කොටසේ ගොවිකම් ව්‍යාප්ති වැඩ විනෝදමත් ක්‍රියාවක්ට පරිවර්තනය වී ඇති බව නිලධාරීන්ගෙන් කියවිණ. ගොවිතැන පිළිබඳව මෙතරම් උනන්දුවක් දක්වන රත්නායක මහතා එතුමාගේ කුඹුරු ඉදිරිපිට තමාගේ ඡායාරූපයක් ගැනීමට අපට අවසර දුන්නේ පළාතේ ගොවිකම් ව්‍යාප්ති වැඩවලට එයින් උපකාරයක් වේය සිතා පමණය.

පරණකුරු කෝරළේ නැගෙනහිර ගොවිකම් ව්‍යාප්ති කොට්ඨාශයෙන් වැඩි කොටසක් තේ, රබර්, පොල් ආදී ස්ථාවර වතු බෝගවලට වෙන්වී තිබේ. මෙම බෝග තුන විශාල වතුවල වෙන් වෙන්ව වගා කර ඇති



නිවසකට යාබද ඩීප් ලිටර් කුකුල් ගෙයක්

අතර මධ්‍යම හා වෙනත් කුඩා ඉඩම්වල එම බෝග හැර වෙනත් සථිර බෝග රාශියක්ද මිශ්‍රව වැවී ඇත.

කඳු හෙල්වලින් සැදි මෙම ප්‍රදේශයේ කඳු අතරැති මිටියාවත් සියල්ල වී ගොවිතැනට වෙන්වී ඇති කුඹුරු වෙති. ප්‍රදේශය දර්ශණීය වූ නමුත් ව්‍යාප්ති වැඩ කිරීම පිණිස කොට්ඨාශයේ සංචාරය කිරීම එතරම් පහසු නොවේ. පහසු නොවූවත් එය විනෝදමත් ගිරිහැරයකි. අහස් ජලයෙන් වැඩ කරන කුඹුරු අක්කර 3,000 හා සුළු වාරිමාර්ග යටතේ අක්කර 500කට අධික ප්‍රමාණයක්ද ඇති මෙම කොටසේ සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය වී අක්කර 3,579 පමණි. මෙම කුඹුරු අක්කර 3,579 ම දියුණු ගොවිතැන් ක්‍රම එකක් හෝ කීපයක් සෑම කන්නයේම මෑතක සිට භාවිතා වන බව දැන ගතිමු. වී ගොවිතැන පිළිබඳ දියුණු ක්‍රම කුඹුරුවල සිරිත් වශයෙන් යෙදීමට පුහුණු වූ කොට්ඨාශයකි මේ. යොදා ඇති දියුණු ගොවිතැන් ක්‍රමවල සංඛ්‍යාවලින් මේ බව විස්තරව පෙනී යයි.

නවීන ගොවි උපකරණ භාවිතය වී ගොවිතැනට යෙදිය හැකි දියුණු ක්‍රමවලින් අඩකි. යකඩ නගුල්, ඇණදත් පෝරු, වල් නෙලන යන්ත්‍ර හා වී වපුරණ යන්ත්‍ර ගොවීන් හොඳින් අඳුනන උපකරණ වෙති. මේවායේ භාවිතය කන්නයෙන් කන්නයම දියුණු වී ඇති බව ව්‍යාප්ති නිලධාරී මහතාගෙන් හෙළි විය. පැළ සිටුවීම පළාතේ යොදන ඉතා ප්‍රසිද්ධ ගොවිතැන් ක්‍රමයකි. සාමාන්‍ය ක්‍රමයට හා පේළි ක්‍රමයට 1960/61 මාස් කන්නයට වගාවූ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණ කුඹුරු ප්‍රමාණයෙන් සියයකට අසූවකට අධික විය. පැළ සිටුවීම බහුලව



මුස්ලිම් මෙනෙවියක් හා ඇගේ කුකුල් රංචුව

කෙරෙන නිසාම ගොයම පෝරු ගෑම දැන් කෙරෙන්නේ ඉතා සුළු වශයෙනි. පේලියට පැළ සිටවූ කුඹුරුවල වල් නෙලීමේ යන්ත්‍ර යෙදීම හා සෙසු කුඹුරුවල අතින් වල් නෙලීම පුරුද්දක් වශයෙන් නොවරදවා ඉටුවන අනෙක් දියුණු ක්‍රම වෙති.

වී ගොවිතැන දියුණු මෙරට බොහෝ පළාත් වල මෙන් දැන් ගොයමට රට පෝර යෙදීම හරණකුරු කෝරළේ නැගෙනහිර කොටසේ ඉතා උනන්දුවෙන් කෙරීගෙන යන කෘෂිකාර්මික ක්‍රියාවකි. පළාතේ විවිධ සේවා සමිතිවලින් රැස්කළ සංඛ්‍යා ලේඛන අනුව කුඹුරුවලට රසායනික පෝර යෙදීමේ ප්‍රමාණය වර්ෂයෙන් වර්ෂයට ඉහළ ගොස් තිබේ. 1960 වර්ෂයේදී පැමිණ ඇති තත්ත්වය නම් පළාතේ ව්‍යාප්ති නිලධාරීන්ට ගෞරවයක් ලබා දිය හැකි තරම් ඉහළකට එළඹීමකි. මෙම කොටසේ ඇති කුඹුරු අක්කර 3,579ට 1958 වර්ෂයේදී රසායනික පෝර හොණ්ඩර 5,880 ක්ද, 1959 දී හොණ්ඩර 7,855 ක්ද, 1960 වර්ෂයේදී හොණ්ඩර 9,390 ක්ද යොදා තිබේ. නියමිත ප්‍රමාණයට නොලැබුවත් පළාතේ සෑම කුඹුරකටම යම් ප්‍රමාණයක හෝ රසායනික පෝර වැටී ඇති බව ගොවිකම් ව්‍යාප්ති නිලධාරී මහතාගෙන් අප ඇසුවේ ඉමහත් ප්‍රීතියෙනි. මේ හැර මිශ්‍ර පොහොර හා කොළ පොහොර යෙදීම ගැනද ගොවීහු මහත් උනන්දුවක් දක්වා ඇත. අක්කරයකින් වී බුසල් 60 සිට 100 දක්වා ප්‍රමාණයක් රැස්කර ගැනීමට ගොවීන් භාග්‍යමත් වූයේ දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කරන අතර එම කුඹුරුවලට මෙවැනි පොහොර ප්‍රමාණයක් යොදන නිසාම වෙයි.

නුමුහුන් වී වගාවේ ප්‍රයෝජනය මෙම පළාතේ ගොවීන්ට දැන් සවිස්තරව තේරී ඇත. පෙර තිබුණ නා නා වී වර්ග සහමුලින්ම නැතිව ඒ වෙනුවට දියුණු කළ නුමුහුන් වී වර්ග පමණක් වගාවෙන දිනය ඉතා මෑත අනාගතයේදී පැමිණෙන බව පෙන්වීමට කරුණු රාශියක් මෙහි තිබේ. 1960/61 මාස් කන්නයට පී. ටී. බී. 16 නුමුහුන් වී අක්කර 2,000 ක්ද, පොඩිවී ඒ 8 අක්කර 700 ක්ද, මුරුංගාකායන් 302 අක්කර 500 ක්ද වගා කර ඇති නිසා ඉතිරිව ඇත්තේ තව කුඹුරු සුළු ප්‍රමාණයකි. මේ හැර එච් 4 නමැති




මාවනැල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රී පී. ආර්. රත්නායක මහතා පුරුක් පණුවන් හානිකර බොල්වූ වී කරල් පරීක්ෂා කරයි.

විශිෂ්ඨතම වියද පළාතට ලඟදී ගෙන්වා වගා කර ඇත. 1958/59 මාස් කන්නයේ සිට මේ දක්වාද නොකඩවා සෑම කන්නයේම පෞද්ගලික නුමුහුන් වී ගොවිපල බැගින් පිහිටුවා ඇති හෙයින් ප්‍රදේශයේ කුඹුරු සියල්ල සම්පූර්ණ නුමුහුන් වී වලින් වගාවීමට ඇති කාලය ඉතා කෙටි බව ස්ථිර වශයෙන් කිව හැක.

සරු ගොයමට කෘමි හානි හා රෝග පීඩා වැඩි වශයෙන් ඇතිවන බව මෙම නිලධාරීන් පමණක් නොව පළාතේ ගොවීන්ටද මනාව අවබෝධ වී ඇති දෑයකි. පුරුක් පණුවා, ගොඩ වෙල්ලා, කොළ කන පණුවා, ගොයම් මැක්කා ආදී කෘමීන් මර්දනය කිරීමට නියමිත කෘමි නාශක බෙහෙත් වර්ග පාවිච්චි කිරීමේ වැදගත් කම පළාතේ ගොවීන් දනී. කෘමි නාශක බෙහෙත් වර්ග සහ බෙහෙත් ඉසීමේ උපකරණ කොට්ඨාශයේ විවිධ සේවා සමුපකාර සමිති මගින් ඉතා පහසු ක්‍රමවලට ගොවීන්ට සපයන බව ව්‍යාප්ති නිලධාරීන් ගෙන් දැන ගතිමු. අවශ්‍ය වූ විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින්ද, ඉහත කී බෙහෙත්



පරණකුරු කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ සාරවත් අඹ තවානක්



පරණකුරු කෝරළේ නැගෙනහිර ව්‍යාප්ති නිලධාරි මණ්ඩලය

වමේ සිට දකුණට ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහතුන් : එච්. පී. විජයරත්න, ඒ. ඇම්. කරුණාතිලක, එච්. ඇම්. අබයරත්න හා බී. ආර්. යූ. බණ්ඩා සහ ගොවිකම් ප්‍රදර්ශිකා මහත්මිය. වාඩිවී—ගොවිකම් ව්‍යාප්ති නිලධාරි ඒ. පී. බස්නායක මහතා

වර්ග හා උපකරණ සපයා දෙනු ලැබේ. ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා දැනට කොට්ඨාශයේ ඇති මෙවැනි උපකරණ ගණන 50ට අඩු නැත. කෘමිහානි හා රෝග උපද්‍රව වලින් වැළැක්වීමට පළාතේ ව්‍යාප්ති නිලධාරි යොදා ඇති මාර්ග ප්‍රසංශනීය බව සඳහන් කළ යුතු කරුණකි.

පරණකුරු කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ ඇති ගම් 103ට ලියාපදිංචි කළ විවිධ සේවා සමූපකාර සමිති 30ක් තිබේ. එක් එක් කන්නයට අවශ්‍ය පොහොර, කෘමිනාශක බෙහෙත්, ගොවි උපකරණ සහ බිත්තර වී කලට වේලාවට ගොවීන්ට සපයා දෙන්නේ මෙම සමිති මගිනි. එම නිසා විවිධ සේවා සමූපකාර සමිතිවලින් පළාතේ ගොවීන්ට මහඟු සේවයක් ඉටුවේ.

මෙම කොට්ඨාශයේ ගොඩ ඉඩම් වැඩි ප්‍රමාණයක ස්ථාවර බෝග වගාවී ඇති හෙයින් විශාල වශයෙන් එළවළු හා අනෙක් වාර්ෂික කවුපි බෝග වගාව අපහසු කරුණක්ව පවතී. එහෙත් ගෙවතුවල බටු, මිරිස්, මෑ, බෝංචි, අල, බතල, කහ, ඉඟුරු, රතුළූනු ආදිය සුළු වශයෙන් වගා කරනු ලැබේ. මේ පිළිබඳව අවශ්‍ය උපදෙස් සියල්ල ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ගොවීන්ට නිතිපතා ලැබේ. කුඩා වතුවල වතු බෝග වගාව පිණිස උපදෙස් පවා ගොවීන් ලබා ගත්තේ මෙම ව්‍යාප්ති නිලධාරීන්ගෙන්ය. මේ අනුව විශෙෂ කාර්යක්ව පවතින්නේ කුඩා වතුවල පස සංරක්ෂණ වැඩ පිළිබඳ ගොවීන්ට විටින් විට සපයන උපදෙස් හා උපකාර වෙති.

වර්ෂයක් පාසා පැවැත්වෙන ජාතික වන මහෝත්සව සමයේදී මෙම කොටස තුළ ගොවිකම් නිලධාරීන් සහ පළාත්වාසීන් මහත් උනන්දුවකින් කටයුතු කරන බව ගොවිකම් ව්‍යාප්ති නිලධාරි මහතාගෙන් හෙළි විය. 1960 වන මහෝත්සව වකවානුවේදී පැවැත්වූ ප්‍රචාරක මහ සභා රැස්වීම් ගණනාවකට පළාතේ මන්ත්‍රී රත්නායක මහතාගෙන් හා ගොවිකම් දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරි මහතුන්ගෙන්ද සහාය ලැබී ඇත. පරණකුරු කෝරළේ නැගෙනහිර කොටසේ වන මහෝත්සව ක්‍රියා ඉතා සාර්ථක බව හෙළි වන්නේ 1960 වර්ෂයට වගා කළ නොයෙකුත් පැළ වර්ග රාශියෙන්ය. දළ වශයෙන් පොල් පැළ 3,200ක්, කෝපි පැළ 5,000ක්, කොස් පැළ 2,100ක්, පුවක් පැළ 1,000ක්, හල්මිල්ල පැළ 195ක්, මහෝගනී පැළ 8,000ක් අඹ පැළ 140ක්, දොඩම් පැළ 350ක්, දෙහි පැළ 70ක්, කතුරුමුරුංගා පැළ 150ක්, රඹුටන් පැළ 25ක් හා ලුනුමිදෙල්ල පැළ 375ක් ද පසුගිය වර්ෂය තුළදී වගා කර තිබීම ගැන අප ඇසුවේ ඉතා සතුටිනි.

ගස් සිටුවීමේ ව්‍යාපාරය ගැන විස්තර දක්වන මෙම අවස්ථාවේ මෙම කොට්ඨාශයේ නවතම ව්‍යාපාරයක් ගැන අප ඇසූ විස්තර සඳහන් කිරීම යෝග්‍ය යයි සිතමු. මෙකල රටේ දෙහි හිඟයක් තිබෙන බවද, වෙළඳාමට ඇති දෙහි මිළාධික බවද, බොහෝ අය දනිති. පළාතේ දෙහි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සෑම ගෙවත්තකම අඩු වශයෙන් එක් දෙහි පැළයක් හෝ රෝපනය කිරීමේ විශෙෂ වැඩ පිළිවෙලක් ගොවිකම් ව්‍යාප්ති නිලධාරී මහතා විසින් ආරම්භ කර ඇති බව දැන ගතිමු. මේ හැර කහ වගාව ව්‍යාප්ත කිරීම පිළිබඳ විශෙෂ වැඩ පිළිවෙලක්ද, මෑතකදී මෙහෙයවා තිබේ. මෙරටට වර්ෂයක් පාසා ගෙන්වන කහ හොණ්ඩර 20,000 නැවැත්වීමට ගන්නා පියවරක් වශයෙන් පරණකුරු කෝරළේ නැගෙනහිර කොටසේ විශෙෂ උත්සාහයකින් කටයුතු කරගෙන යන අතර සෑම ගෙවත්තකම පවුලට සෑහෙන කහ ප්‍රමාණය හෝ වගා කිරීමට විධිවිධාන යොදා ඇත.

මෙම කොට්ඨාශය සත්ව පාලනය පිළිබඳ රටේ මූලිකස්ථානයක් නොගන්නා මුත් සත්ව පාලනය ද ගොවිතැන් වැඩවලට අතිරේක වශයෙන් ඉතා උනන්දුවෙන් කෙරෙන කාර්යයකි. වී ගොවිතැනට අවශ්‍ය මී ගව සංඛ්‍යාව ප්‍රදේශයේ ප්‍රමාණවත්ව සිටීම වැදගත් කරුණකි. එළ ගවයන් ඇතිකර කිරි නිෂ්පාදනය පවා මෙම කොට්ඨාශයේ අතපසු වී නැත. හොඳ වර්ගවල කිරි දෙනුන් සොයා ගැනීමට ගොවීන් විශෙෂ ආශාවක් දක්වයි. දෙපාර්තමේන්තුව මගින් සපයන හොඳ වර්ගයේ වසුපැටවුන් මාරුකිරීමේ ව්‍යාපාරයට ද ගොවීන්ගේ ලැදියාවක් ඇති බව සඳහන් වී තිබේ.

කුකුළන් ඇති කිරීම ඈත අතීතයේ සිට මෙම කොට්ඨාශයේ කෙරෙන නමුත් ඩිප්ලිටර්

ක්‍රමයට පක්ෂීන් ඇති කිරීමට මෑතක සිට ගොවීන් උනන්දුවක් දක්වා ඇත්තේ ව්‍යාප්ති නිලධාරීන්ගේම ක්‍රියාශීලීකම නිසාය. ඩිප් ලිටර් ක්‍රමයට කුකුල් ගෙවල් 25ක් පමණ පළාතේ දැනට ඉදිකර තිබෙන අතර ඒවා තුළ ඇති කරන දියුණු වර්ගවල පක්ෂීන් ගණන 1,500ට අඩු නොවේ. දිනක් වයසැති පැටවුන් ආදිය දෙපාර්තමේන්තුවෙන් නිතිපතා සැපයෙන නිසා නුදුරු අනාගතයේ දී මෙම කොට්ඨාශය පවා කුකුළන් ඇති කිරීමේ දියුණු ප්‍රදේශයක් වෙනවා නිසැකය.

තරුණ ගොවි සමාජ පිළිබඳ වැඩ කටයුතු මෙම කොට්ඨාශයේ ඉටුවන්නේ ඉතා ඉහළ තත්ත්වයකටය. කෑගලු දිසාවේ තරුණ ගොවි සමාජ සැමවිටම දියුණු තත්ත්වයක ඇති බව දිවයිනේ පතලවූ කීර්තියකි. අද පවා මේ තත්ත්වය වෙනස් වී නැත. කෑගලු දිසාවේ ව්‍යාප්ති කොට්ඨාශ අතුරින්ද පරණකූරු කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ ඇති තරුණ ගොවි සමාජ මුල් තැනක් ගන්නා බව පිළිගෙන තිබේ. ක්‍රියාශීලී සමාජවලින් පමණක් නොව වර්ෂයකට වරක් පැවැත් වෙන තරුණ ගොවි සමාජ කොට්ඨාශ සම්මේලනවලින් පවා මෙම කොට්ඨාශය මුල් තැන ගන්නා බව ඔප්පුවී ඇත. දැනට කොට්ඨාශයේ ලියාපදිංචිවූ සමාජ 24ක් හා ලියාපදිංචිය අපෙක්ෂාවෙන් සිටින සමාජ 8ක් ද තිබේ. තරුණ ගොවි සමාජ ව්‍යාපාරයට ඇබ්බැහිවී සිටින තරුණ පරපුර දහසකට අධික ගණනාවකි. කොට්ඨාශයේ ඇති ගම් 103නේ ගමකට එක් සමාජය බැගින් පිහිටුවීම ව්‍යාප්ති නිලධාරීන්ගේ පරමාර්ථ යයි. නමුත් සමාජ පිහිටුවීම ඒ ඒ ගම්වල තරුණ තරුණියන්ගේම උත්සාහය හා උනන්දුව අනුව ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ව්‍යාපාරය වඩා ශක්තිමත් අත්තිවාරමක ගොඩ නැංවෙන බව නිලධාරීන් දනිති. අළුත් සමාජ ලහිලහියේ පිහිටුවීමෙන් ඔවුන් වලකින්නේ මෙම කරුණු නිසායි. දැනට පිහිටුවා ඇති සමාජවලට ඉතා වැදගත් අරමුණු මාලාවක් තිබීම සමාජවල ප්‍රාණවත්කම ඔප්පු කරන නිදසුනකි. තරුණ තරුණියන් දෙපක්ෂයට යෝග්‍ය අරමුණු ක්‍රියාවේ යොදා ඇති අතර ඒවායින් ප්‍රයෝජන තරුණ ගොවීන් පමණක් නොව වැඩිහිටි ගොවීන්ද ලබති. බොහෝවිට වැඩිහිටි අයගේ නායකත්වයෙන් මෙහි සමාජ වැඩ ඉටුවන නිසා ව්‍යාපාරයට ඉතා හොඳ අනාගත යක් ළඟාවන බව පෙනී යයි.

පරණකූරු කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ කෘෂිකාර්මික වැඩ නැරඹීමෙන් කරුණු රාශියක් අපි උගතිමු. පළාතේ ප්‍රභූන්ගේ හා රජයේ අනෙක් නිලධාරීන්ගේ සිත් දිනා ගොවීන්ගේ ආදර ගෞරවය හිමිකර ගත් ගොවිකම් ව්‍යාප්ති නිලධාරි මඬුල්ලකට සාර්ථකව ඉටු කළ නොහැකි කෘෂිකාර්මික ව්‍යාපාරයක් නොමැති බව අප දුටු කරුණු වලින් ඉතා වැදගත් දැය වෙයි. දිවයිනේ ව්‍යාප්ති වැඩවල යෙදී ඇති සෙසු නිලධාරි මහතුන්ද මෙය තරයේ සිහි තබා ගැනීමෙන් නුදුරු අනාගතයේදී මෙරට සවර්ණමය කෘෂිකාර්මික යුගය නිත්‍ය වශයෙන් ඇතිවන බව අපගේ අදහසයි.